# අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) සමාජ අධ්‍යයනය විෂයයේ අභ්‍යන්තර ඇගයීමේ දී සාධනය තක්සේරු කිරීම සඳහා යොදා ගන්නා පාසල් පරීක්ෂණ සහ අනෙකුත් ඇගයීම් විධිවල යෝග්‍යතාව පිළිබඳ විමර්ශනයක්.

ඩබ්ලිව්. එම්. පී. රේණුකා වනසුන්දර
ශාස්ත්‍රවේදී උපාධිය - 1985 (කොළඹ වි.වි.)
පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා - 1993 (කොළඹ වි.වි.)
අධ්‍යාපනපති උපාධිය - 1997 (කොළඹ වි.වි.)

UCLIB
532622

අධ්‍යාපන දර්ශනපති උපාධිය සඳහා ඉදිරිපත් කරන
අධ්‍යාපන පර්යේෂණ නිබන්ධය.

අධ්‍යාපන පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය.

2003 / 2005

## අධ්‍යයන සාරාංශය

අද්‍යතන අධ්‍යයනය මූලික වශයෙන් යොමු වී ඇත්තේ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමන්‍ය පෙළ) සමාජ අධ්‍යයනය විෂයයේ අභ්‍යන්තර ඇගයීමේදී ශිෂ්‍ය සාධනය තක්සේරු කිරීම සඳහා යොදා ගන්නා පාසල් පරීක්ෂණ සහ අනෙකුත් ඇගයීම් විධිවල යෝග්‍යතාව සහ වලංගුතාව පිළිබඳ විමර්ශනයක් කිරීම පිණිසය.

මෙම අධ්‍යයනය පහත සඳහන් සුවිශේෂ අරමුණු පදනම් කොට ගෙන ක්‍රියාත්මක කරන ලදි.

★ අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ ශ්‍රේණිවල සමාජ අධ්‍යයනය විෂයයේ සාධනය මැනීම සඳහා යොදාගනු ලබන පාසල් පරීක්ෂණවල වලංගුතාව හා ප්‍රායෝගික බව කොතෙක් දුරට පවතී දැයි පරීක්ෂා කර බැලීමට

★ දැනට ක්‍රියත්මක වන පාසල පදනම් කරගත් ඇගයීම් වැඩ පිළිවෙළේ දුර්වලතා හඳුනාගැනීම.

★ මේ නිසා ගුරු, සිසු හා දෙමාපියන්ට මතුවූ ගැටලුවලට යෙදිය හැකි විසඳුම් සොයා බැලීම.

★ ඉදිරි අනාගතයේ දී පාසල් පරීක්ෂණ හා අනෙකුත් ඇගයීම් විධි සාර්ථකව කරගෙන යාමට අවශ්‍ය යෝජනා හා අදහස් ඉදිරිපත් කිරීම.

මෙම නිබන්ධයේ පළමුවන පරිච්ඡේදයේ ඇතුළත් වී තිබෙන්නේ එහි ගැටලුව, පාසල් පද්ධතිය තුළ පාසල් පරීක්ෂණ මෙන්ම පාසල පදනම් කරගත් ඇගයීම් වැඩ පිළිවෙළක අවශ්‍යතාව, අරමුණු දැක්වීම, අධ්‍යයනයේ ප්‍රායෝගික වැදගත්කම ආදිය කෙටියෙන් විස්තර කිරීමයි.

දෙවන පරිච්ඡේදය යොමු වන්නේ සමාජ අධ්‍යයනය විෂයයට අදාළ විෂය කරුණු විවිධ ශ්‍රේණිවල පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයය තුළ අන්තර්ගතවී ඇති අන්දමත් 1972 සිට සමාජ අධ්‍යයනය විෂයය පාසල් පද්ධතියට හඳුන්වා දුන් ආකාරයත් එතැන් සිට එම විෂයයේ සිදුවූ විකාශයත් පිළිබඳ තොරතුරු ගෙනහැර දක්වීමටය.

තුන්වන පරිච්ඡේදය පර්යේෂණ සාහිත්‍ය විමර්ශනය සඳහා වෙන්ව ඇත. පාසල් පරීක්ෂණ යොදා ගැනීමේ ගැටලු හා එම පරීක්ෂණවල වැදගත්කම හා ප්‍රයෝජන පිළිබඳවත්, පාසල් පරීක්ෂණ මුහුණ දෙන ප්‍රායෝගික දුෂ්කරතා

සම්බන්ධයෙන් සිදුවී ඇති පර්යේෂණ පිළිබඳවත් විමර්ශනයක් මෙම පරිච්ඡේදය ඉදිරිපත් කරයි.

හතරවන පරිච්ඡේදයට අයත් වන්නේ පර්යේෂණ ක්‍රම පිළිවෙත පිළිබඳ කරුණුය. එනම් අධ්‍යයනය ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගත් ක්‍රමවේදය නියැදිය හා දත්ත රැස්කළ උපකරණ පිළිබඳවත්ය.

පස්වන පරිච්ඡේදය මගින් දත්ත විශ්ලේෂණය හා අර්ථකථනය කර තිබේ. හතරවන පරිච්ඡේදයේ විස්තර කරන ලද දිස්ත්‍රික්ක තුනේම අවසාන වාර පරීක්ෂණවල සමාජ අධ්‍යයනය I හා II ප්‍රශ්න පත්‍රවල වලංගුතාව හා ප්‍රායෝගික බව එම පළාත් තුනේම ශිෂ්‍යයින්ට ගුරුවරුන්ට හා දෙමාපියන්ට දුන් ප්‍රශ්නාවලි ආශ්‍රිතව ලබාගත් තොරතුරු ශිෂ්‍යයින්ගේ ප්‍රතිචාර, ගුරුවරුන්ගේ ප්‍රතිචාර හා දෙමව්පියන්ගේ ප්‍රතිචාර නමැති ශීර්ෂ තුන යටතේ ගොනු කොට විශ්ලේෂණයක් කෙරිණි. මේ සඳහා තෝරාගත් නියැදියට කොළඹ, රත්නපුර, හම්බන්තොට දිස්ත්‍රික්කවලට අයත් 1 AB, 1C හා 2 වර්ගයේ පාසල් 18 ක සිසුන් 540 ක් නියැදිය වශයෙන් තෝරා ගැනිණි. එසේම පාසල් 18 හි ශිෂ්‍ය නියැදියේ අහඹු ලෙස තෝරාගත් දෙමව්පියන් 80 ක් ද, එසේම පාසල් 18 න් තෝරාගත් ගුරුවරුන් 135 ක් ද, නියැදිය වශයෙන් තෝරාගන්නා ලදි. දත්ත විශ්ලේෂණයේ දී ඒ සඳහා යොදාගත් ප්‍රශ්නාවලි තුනේම සමාන අදහස් දැක්වෙන ප්‍රකාශවලට ලැබුණු පිළිතුරුවල ප්‍රතිශත සංඛ්‍යාවල මධ්‍යන්‍යය ගණනය කර ඒ අනුව අදාළ අදහස්වලට දක්වා ඇති පිළිතුරුවල ප්‍රතිශත සංඛ්‍යා වගු වශයෙන් ඉදිරිපත් කර තිබේ. එසේ කිරීමට නොහැකි වූ ප්‍රකාශවලට ලැබුණු පිළිතුරු වෙන වෙනම විශ්ලේෂණය කර දිස්ත්‍රික්ක වෙන වෙනම තුළනාත්මකව සසඳා එහි අදහස් දක්වා තිබේ.

හයවන පරිච්ඡේදය මගින් මෙම කරුණුවලට අදාළව නිගමන හා යෝජනා ඉදිරිපත් කර තිබේ. පාසල් පරීක්ෂණවල වලංගුතාව පිළිබඳ දුර්වලතා තිබුණත් ප්‍රායෝගික බව ආරක්ෂා වී ඇති බවක් පෙනේ. වලංගුතාව සම්බන්ධයෙන් සලකන විට විෂය මූලික වලංගුතාව ප්‍රමාණවත් නොවන බව පෙනුණි. එසේම පාසල පදනම් කරගත් ඇගයීම් සම්බන්ධව සිසු, ගුරු හා දෙමාපිය අදහස් විශ්ලේෂණය මගින් ලැබුණු නිගමන හා යෝජනා ඉදිරිපත් කර ඇත. පාසල් පද්ධතිය තුළ පරීක්ෂණ ක්‍රියාවලිය හා පාසල පදනම් කරගත් ඇගයීම් වැඩ පිළිවෙළ ඇතුළුව අනෙකුත් ඇගයීම් විධි සකස් කළ යුතු ආකාරයත්, ඉවත් කළ යුතු අංශ පිළිබඳවත් යෝජනා ඉදිරිපත් කර තිබේ.

## Abstract of the Study

The present study is basically aimed at examining the validity and the appropriateness of school evaluation procedures and other evaluation strategies employed in relation to the Social Studies subject at the General Education Certificate (Ordinary Level) classes.

The study was based on the specific objectives such as

1. Examining the degree of validity and practicality of school tests used for measuring the students' achievement in social studies.
2. Identifying the weaknesses of the present School Based Assessment programme.
3. Identifying the problems faced by parents and students in implementing the school based Assessment programme.
4. Suggesting measures to improve the school tests and School Based Assessment programme.

The first chapter of the thesis presents in brief the problem of the study, the need for having a school testing programme and a School Based Assessment programme, the objectives of the study and the practical significance of the study.

The second chapter is devoted to describe how the concepts and relevant themes are incorporated in the subject environmental studies and also how social studies subject was introduced to the school curriculum in 1972 and how it has undergone a systematic development up to the present era in the school system.

The third chapter presents a review about the related research studies. In this chapter the research studies related to problems in school testing programmes, the importance and practical difficulties in having such programmes are being reviewed.

The chapter four details out the methodology used in the present study. The chapter includes a description about the sample used and techniques employed for the collection of data.

The fifth chapter presents an account of data analysis. The collected data for the three districts described in the chapter four are presented in this chapter. The validity and the practicality of the first and second papers in Social Studies of the final term test were examined under three themes on students' responses, Teachers' responses and Parents' responses. The data collected through questionnaire from students, teachers and parents also were analyzed under the above three themes. The sample used for the analysis comprised of 540 students selected from 18 schools sampled from 1AB, IC and 2 types in Colombo, Ratnapura and Hambantota Districts. A sample of 80 parents was randomly selected from the 18 schools to collect background information. Also a sample of 135 teachers was selected randomly from the 18 schools. In the analysis of data the similar responses received for questions were converted into percentages and then the mean values of the percentages were used for the analysis. These mean values of percentages are presented in tables. The responses, which were different from one another were analyzed separately and were used for a comparative analysis of responses of each District.

The sixth chapter presents the findings and the conclusions. It reveals that school tests lack validity while they maintain a high degree of practicality. The content validity of papers were not satisfactory. Also the chapter presents the ideas and opinions of the student, teacher and parent samples with regard to the School Based Assessment programme. The recommendations made by the study include suggestions made for the improvement of the school testing programmes and the other evaluation procedures including the School Based Assessment programme. Also the suggestions include the aspects that should be improved and dropped in the School Based Assessment programme.